# පුස්කොළ පොත් ලේඛනයේ දී වෙදපොත් රචනා ශෛලියේ සුවිශේෂිතා

යූ.බී.ජී.එස්.එස්. කුමාරි[1], ආර්.කේ.ඊ. අල්පොන්සු[2], ඩබ්.ඒ.එම්.සී.එම්. අධිපත්තු[3]

පුස්කොළ පොත් ලේඛනයේ දී විවිධ කරුණු අරභයා රචනා කරන ලද පොත් හඳුනාගත හැකි අතර වෙදපොත් ඒ අතරින් සුවිශේෂී වේ. හෙළ වෙදකම මුඛ පරම්පරාගතව හා ලේඛනය මඟින් අදට ද පවත්වාගෙන එනු ලබේ. හදිසියේ සිදුවන සර්ප දෂ්ටනයක්, අස්ථි බිඳීමක්, උළුක්කුවක්, උදරාබාධයක් වැනි රෝගවල පටන් දරුවෙකු ප්‍රසූත කරන කාර්යයක දී වුවත් ගමේ වෙදමහතාගේ සේවාව ලබාගැනීමේ සංස්කෘතියක් පුරාණ ගැමියන් අතර පැවතිනි. එම බෙහෙත්-හේත් වට්ටෝරු මතක තබාගැනීමට හා අවශ්‍ය ඕනෑම මොහොතක ප්‍රතිකාර කිරීමේ අරමුණින් එම බෙහෙත් වට්ටෝරු පුස්කොල පොත්වල ලියා තැබීමේ දී යොදාගත් භාෂාමය හා ලේඛනමය රචනා ශෛලියන් හි සුවිශේෂිතාවක් වුයේ ද යන්න පිළිබඳව අධ්‍යයනය කිරීම මෙහි අරමුණ වේ. මේ සඳහා ගල්ගමුව නාහෙට්ටිකුලම ප්‍රදේශයේ වන්නිබණ්ඩාර වෙදමහතාගේ පුස්කොළ පොත් එකතුව පරිශීලනය කළ අතර ඔහු සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම හා සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයනක් මඟින් ද දත්ත රැස්කරගන්නා ලදි. දේශීය වෙදකම තුළ දැකගත හැකි ප්‍රධාන ලක්‍ෂණයක් නම් බෙහෙත් වට්ටෝරු ලිඛිතව හා මුඛ පරම්පරාගතව පවත්වාගෙන යාමයි. එසේම දේශීය වෙදකම තුළ ප්‍රතිකාර කිරීමේ දී ශාරීරිකව හා මානසිකව කරනු ලබන ප්‍රතිකාර දැකගත හැකිය. වෙදපොත් ලේඛනයේ දී ආකාර කිහිපයක රචනා ශෛලීන් හා භාෂා උපක්‍රම හඳුනාගත හැකිය. එනම් බෙහෙත් වර්ග ලියා තැබීම, ප්‍රතිකාර කළ යුතු ආකාරය පිළිබඳ විස්තර, රෝග ලක්ෂණ හඳුනාගැනීම හා නිමිති බැලීම ආදිය කාව්‍යය ස්වරූපයෙන් සිව්ප ද ආකෘතිය යොදාගෙන එළිවැට, අනුප්‍රාස රසය ජනනය වන ආකාරයට රචනා කර ඇත. එසේම ඇතැම් යන්ත්‍ර හා මන්ත්‍ර රූප සටහන් මඟින් දැක්වීම ද සිදුකර තිබේ. ලේඛනයේ දී බැඳි අක්ෂර භාවිතය හා ඇතැම් පද සන්ධි කරමින් ලියා දැක්වීම ද ව්‍යංගයෙන් ඇතැම් පද දැක්වීම ද සිදුකර තිබේ. පුස්කොළ පොත් රචනා කිරිමේදී පිටු අංක කිරීම සඳහා යොදනු ලබන සිංහල අක්ෂර ක්‍රමය හා වාක්‍යය වෙන් කිරීම සඳහා කුණ්ඩලිය යොදාගැනීම මෙම වෙද පොත් තුළ ද හඳුනාගත හැකිය. මෙම වෙදපොත්වල දැකිය හැකි සුවිශේෂී ලක්ෂණයක් ලෙස බෙහෙත් වට්ටෝරු හා ප්‍රතිකර්ම දැක්වීමේ දී සංකේත දක්වා තිබීම දැක්විය හැකිය. මෙම අධ්‍යයනය තුළින් පුස්කොළ පොත් ලේඛනය තුළ වෙදපොත් ලේඛනය සඳහා ආවේණික රචනා ශෛලියක් ඇති බව හඳුනාගත හැකි විය.

ප්‍රමුඛ පද : පුස්කොළ පොත්, වෙද පොත්, රචනා ශෛලිය, භාෂා ලක්ෂණ

[1] භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. suranjikadhrmasiri@gmail.com

[2 3] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
chanakamadhumaladhipaththu@gmail.com